# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1799/3 – 2013 පෙබරවාරි 27 වැනි බදාදා – 2013.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තු දකුණ සුළු කොට්ඨාසයේ, පදියතලාව (ටොපො පීපී 49) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ඒඑම්/පීඩීවයි/2011/183 හා 2012.02.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.2212ක් පමණ වන පස්කන්දවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – පස්කන්දවත්ත – ප්‍රමාණය: **හෙක්. 0.2212ක් පමණ**

උතුරට: කැබලි අංක 1223 සහ ඊ. ජේ. පී. ලලිත් එදිරිවීර හිමිකම් කියන පස්කන්දවත්ත (කැබලි අංක 1201); නැගෙනහිරට සහ දකුණට: ඊ. ජේ. පී. ලලිත් එදිරිවීර හිමිකම් කියන පස්කන්දවත්ත (කැබලි අංක 1201 සහ 1202); බටහිරට: ඊ. ජේ. පී. ලලිත් එදිරිවීර හිමිකම් කියන පස්කන්දවත්ත (කැබලි අංක 1202 සහ 1223).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: LD/05/2009/WS/31.
2012 නොවැම්බර් මස 29 වැනි දින.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 604

1A – G 17345 – 350 (2013/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*